


# අවුරුදු උදානය - අවුරුදු උළෙල

අවුරුද්ද යනු දින 360 ක් ඉක්මී ලබන්නා වූ උතුම් විශේෂ දිනයකි. එක පැත්තකින් මේ දවස සංස්කෘතික වටිනාකමකින් යුතු ජන ජීවිතය අර්ථවත් කරන දවසක්. තවත් විදිහකට අර්ථ දැක්වූ විට කිව හැක්කේ පවුලේ සාමාජිකයන් එක් කළ යහලුවන් නෑදෑයන් ගමේ පිරිස එක්ම දිවක සතුටින් සමාදානයෙන් සහභාගිවන විශේෂිත උත්සවයක් හැටියටයි.

සිංහල අපුත් අවුරුද්ද ලබන්නේ බක් මාසයේ. අප්‍රේල් මාසය ගමේ ජීවත්වන්නන්ට සශ්‍රීක වූ අටු කොටු පිරී ඉතිරී ගිය සුන්දර මාසයක්. මුලින් ලබාගත් අස්වැන්නෙන් බුදුන්ට දෙවියන්ට පූජා කොට දෙවැනි භාගය තමාගේ පරිභෝජනයට ගැනීම ගැමියාගේ කලක් පවත්වොගෙන ආ චාරිත්‍ර ධර්මයක්. එදා ආදි කාලයේ සිට පවත්වොගෙන ආ මෙවන් සංස්කෘතික දිනයක් අද දක්වාම ශ්‍රී ලාංකිකයන් තුළ ගොඩනැගුනේ අතීතයෙන් ගෙනා සාර ධර්ම යහපත්කම් චාරිත්‍ර වාරිත්‍ර ඉදිරියටත් පවත්වාගෙන යමින් තම දූ දරුවන්ටද පූර්වාදර්ශයක් ගෙන දෙමින්.

වාර්ෂිකව පවත්වාගෙන එන චාරිත්‍රයක් ලෙස බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය මෙවරත් අලුත් අවුරුදු උත්සවය ඉතා සංවිධානාත්මකව විවිධ සංස්කෘතික අංග ඇතුළත් කරමින් පැවැත්වීමට කටයුතු සංවිදානය කොට තිබෙනවා. විශේෂයෙන් සෑම වසරකදීම විහාරයට අනුබද්ධිත සිංහල භාෂා පාසල මූලික කරගනිමින් එහි දූ දරුවන් දෙමාපියන් ප්‍රදේශවාසීන් ගේ සහභාගිත්වයෙන් කරන සංස්කෘතික උත්සවය මෙවරත් පවත්වන්නට සියලු කටයුතු සූදානම්. මුලිදී සඳහන් කළ ලෙස මෙම සංස්කෘතික දිනය පවත්වනු ලබන්නේ වැඩිහිටියන්ට වඩා මේ රටේ ජීවත්වන අපේ දූ දරුවන් වෙනුවෙන්. අපේ අනාගත දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා වාසී අපේ දරුවන්ට වඩා මෙහේ ජීවත්වන දරුවන්ට අපේ චාරිත්‍ර වාරිත්‍ර ගැන කියලා දෙන්න ඒ සඳහා හුරුකරවන්න විනෝද දවසක් මේ අවුරුදු දවස.

විශේෂයෙන් මේ දවසෙදි තවත් විශේෂ දෙයක් සිදුවෙනවා. ප්‍රදේශවාසී හිතවතුන් වගේම එකට සිංහල පාසලේ ඉගෙන ගන්නා දූ දරුවන්ට හොඳ දවසක් ආයෙත් මුණගැසෙන්නට කතා බස් කරන්නට හෝ හිතවතුන්ට යාලු මිත්‍රයන්ට තරගවලට සහභාගිවන්නටත් පුලුවන්. උදේ සිට සවස්වන තුරු නැකතට කිරිබත් කැවුම්වල මුං කැවුම් කොකිස් වල රස බලන්න දවසම යාලු මිත්‍රයන් දෙමාපියන් සමග ගත කරන්න හොඳම දවස අපේ අවුරුදු උත්සවයයි.

මෙවරත් අවුරුදු උදානය බක්මහ උළෙල 2016 අවුරුද්ද සඳහා අප්‍රේල් 17 ඉදිරා උදේ 9 සිට පැවැත්වීමට සංවිධායක මණ්ඩලය සියල්ල සූදානම් කර තිබෙනවා. බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය 15 වන වරටත් මේ අනභිබවණීය උත්කර්ශවත් උත්සවය Deer Park Sasella Park හිදී පවත්වනවා. චාරිත්‍රාණුකූලව පවත්වන අවුරුදු කෑම මේසය උදේ 9 ට ආරම්භ වෙනවා. අනතුරුව දරුවන් වැඩිහිටියන්ට උණු1 උණු ආහාර සාධාරණ මිලකට ලබාගන්න සංවිධානය කර තිබීම විශේෂයක්. මේ උත්සවයඅතුතු සංස්කෘතික අංගද ඇතුළත්වෙනවා. විශේෂයෙන් ඇබොරිජිනල් ආදිවාසීන්ගේ සංස්කෘතික අංගයක්ද ඇතුළත්. වෙළඳ කුටි තොරතුරු මධ්‍යස්ථාන මෙයට ඇතුළත් වෙන තවත් අංගයක්. ඔබ සැමට ආරාධනා.

**මහින්ද දිසානායක දිවුල්ගනේ**



